# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2216/38 - 2021 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 40/1973 (I)

**(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත**

(222 වන අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**පවිත්‍රා වන්නිආරච්චි,**
සෞඛ්‍ය අමාත්‍ය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත 1925 අගෝස්තු මස 28 වැනි දින, අංක 7481 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ධාන්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් වන හා ඇන්කිලොස්ටොමියාසිස් සම්බන්ධයෙන් වන නිරෝධායන නියෝගවල, 61අ නියෝගය, පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් ඒ නියෝග තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :

(1) එහි "මෘත දේහය ආදාහනය කිරීම-" යන වචන වෙනුවට "මෘත දේහය ආදාහනය කිරීම හෝ භූමදානය කිරීම-" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (1) වන අනුනියෝගයේ "යම් තැනැත්තකුගේ මෘත දේහය" යන වචන වෙනුවට "යම් තැනැත්තකුගේ මෘත දේහය ආදාහනය හෝ භූමදානය කරනු ලැබිය හැකි ය. ආදාහනය සම්බන්ධයෙන් වන විට දී එකී තැනැත්තාගේ මෘත දේහය" යන වචන ආදේශ කිරීමෙන් ;

1A - G 33766 — 525 (2021/02)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) එහි (1) වන අනුනියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුනියෝගය ඇතුළත් කිරීමෙන් :-

"(1අ) භූමදානය සම්බන්ධයෙන් වන විට දී, ඒ තැනැත්තාගේ මෘත දේහය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව නිසි බලධරයා විසින් අනුමත කරන ලද සුසාන භූමියක හෝ ස්ථානයක ඒ බලධරයාගේ අධීක්ෂණය යටතේ භූමදානය කරනු ලැබිය යුතු ය.".

(4) එහි (2) වන අනුනියෝගයේ "ආදාහන කටයුතු" යන වචන වෙනුවට "ආදාහන කටයුතු හෝ භූමදාන කටයුතු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(5) (3) වන අනුනියෝගයේ "ආදාහන අවස්ථාවේ දී මිනී පෙට්ටිය ද සමඟින් පුළුස්සා දමනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ආදාහන අවස්ථාවේ දී මිනී පෙට්ටිය ද සමඟින් පුළුස්සා දමනු ලැබිය යුතු ය හෝ භූමදානය සම්බන්ධයෙන් වන විට දී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූල යම් පියවර ගනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.